# ACCOUNTING FOR NON-PROFIT ORGANISATION (Part-I)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# ලාභ අරමුණු කර නොගත් සංවිධාන

සාමාජික හා සමාජ සුභ සාධනයට හා අභිවෘද්ධිය අරමුණු කර ගත් සංවිධාන ලාභ අරමුණු කර නොගත් සංවිධාන ලෙස හැඳින්වේ.

**නිදසුන් :**

ක්‍රීඩා සමිති, සංවිධාන
අවමංගල්‍යාධාර සමිති
තරුණ සංවිධාන
ආගමික සංවිධාන

ClassWork.LK

# ලාභ අරමුණු කර නොගත් සංවිධාන ගිණුම් තැබීමේ අවශ්‍යතාව

ලාභ අරමුණක් නැතත් මෙවැනි සංවිධාන ආර්ථිකමය කටයුතුවල දී නිරත වේ.

එමෙන්ම සාමාජිකයිගේ මුදල් ලබා ගනියි. මෙවැනි ආර්ථිකමය කටයුතුවල නිරත වන බැවින් ඒ පිළිබඳ නිවැරදි තොරතුරු සාමාජිකයන්ට ලබාදීම සඳහා ගිණුම් තැබීමක් අවශ්‍ය වේ.

ClassWork.LK

# ලාභ අරමුණු කර නොගත් සංවිධාන සකස් කරන ගිණුම් හා වාර්තා

- ලැබීම් හා ගෙවීම් ගිණුම/මුදල් ගිණුම
- සාමාජික මුදල් ගිණුම
- ආදායම් හා වියදම් ගිණුම / ආදායම් ප්‍රකාශනය
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
- බාහිර ක්‍රියාකාරකම්වලින් සිදු වන ප්‍රතිඵල ගණනය කිරීම සඳහා පිළියෙල කරන ආදායම් ප්‍රකාශනය

ClassWork.LK

# සාමාජික මුදල් ගිණුම

ලාභ අරමුණු කර නොගත් සංවිධානවල ප්‍රධාන ආදායම් මාර්ගය සාමාජික මුදල් වන බැවින් ඒ සඳහා පවත්වා ගෙන යනු ලබන ගිණුම සාමාජික මුදල් ගිණුම නම් වේ.

# සාමාජික මුදල් ගිණුමේ අන්තර්ගත තොරතුරු

වර්ෂය ආරම්භක දිනට - හිඟ හිටි සාමාජික මුදල්

- කලින් ලද සාමාජික මුදල්

වර්ෂය අවසාන දිනට - හිඟහිටි සාමාජික මුදල්

- කලින් ලද සාමාජික මුදල්

වර්ෂය තුළ ලැබූ සාමාජික මුදල්

වර්ෂයට අදාළ සාමාජික මුදල

Class Work LK

# ලැබීම් හා ගෙවීම් ගිණුම / මුදල් ගිණුම

ගිණුම් කාලච්ඡේදය තුළ සංවිධානයට මුදලින් ලැබූ හා සංවිධාන විසින් මුදලින් ගෙවූ වටිනාකම පමණක් සාරාංශ කර ඇතුළත් කරන ගිණුම, ලැබීම් ගෙවීම් ගිණුමයි.

මෙය මුදල් පදනමට පිළියෙල කරයි.

ClassWork.LK

# <u>ආදායම් ප්‍රකාශනය / ආදායම් හා වියදම් ගිණුම</u>

කාලච්ඡේදයට අදාළ ආදායම් හා වියදම් ඇතුළත් කර සකස් කරන ලේඛනය ආදායම් ප්‍රකාශනයයි.

මෙය උපචිත පදනමට පිළියෙල කරයි. මෙහි ප්‍රතිඵලය අතිරික්තය හෝ ඌණතාව ලෙස හැඳින්වේ.

## <u>අතිරික්තය</u>

කාලච්ඡේදයේ වියදමට වඩා වැඩි ආදායම් ප්‍රමාණය අතිරික්තය ලෙස හැඳින්වේ.

## <u>ඌණතාව</u>

කාලච්ඡේදයේ වියදමට වඩා ආදායම් ප්‍රමාණය අඩු නම් එම අඩු වූ ප්‍රමාණය ඌණතාව ලෙස හැඳින්වේ.

ClassWork.LK

# <u>සමුච්චිත අරමුදල</u>

ආදායම් හා වියදම් ගිණුමේ අතිරික්ත එක් රැස්වීමෙන් ගොඩ නැගෙන අරමුදල සමුච්චිත අරමුදල ලෙස හැඳින්වේ.
සෑම වසරක ම අතිරික්ත එකතු වීමෙන් සමුච්චිත අරමුදල ගොඩ නැගේ.

එමෙන් ම නිශ්චිත දිනකට පැවැති මුළු වත්කම් වටිනාකමෙන් මුළු වගකීම් වටිනාකම අඩු කර සමුච්චිත අරමුදල ගණනය කරයි.

අතිරික්තය නිසා සමුච්චිත අරමුදල වැඩි වන අතර ඌණතාවය නිසා සමුච්චිත අරමුදල අඩු වේ.

ClassWork.LK

# බාහිර ක්‍රියාකාරකම්වලින් සිදු වන ප්‍රතිඵල ගණනය කිරීම සඳහා පිළියෙල කරන ආදායම් ප්‍රකාශනය

ලාභ අරමුණු කර නොගත් සංවිධාන සිය දියුණුව හා සංවර්ධනය කර ගැනීමේ අරමුණින් ප්‍රධාන අරමුණට අමතරව ලාභ අරමුණු සහිත ව බාහිර ක්‍රියාකාරකම්වල නිරත වේ.

**නිදසුන් :**

- ආපනශාලා පවත්වා ගෙන යාම
- ක්‍රීඩා තරග පැවැත්වීම
- නාට්‍ය සංදර්ශන පැවැත්වීම

මේවායේ ප්‍රතිපල වෙන ම ගණනය කර, එය ආදායම් ප්‍රකාශනයට / ආදායම් හා වියදම් ගිණුමට ඇතුළත් කළ යුතු ය.

ClassWork.LK

# යාවජීව සාමාජික මුදල්

සංවිධානයේ සාමාජිකයන් මුළු ජීවිත කාලය සඳහා ම එකවර මුදලක් ගෙවා ලබා ගන්නා සාමාජිකත්වය වෙනුවෙන් ලැබෙන මුදල් යාවජීව සාමාජික මුදල් ලෙස හැඳින්වේ.

මෙය එකවර ලැබෙන මුදලක් බැවින්, වර්ෂයට අදාළ ව සමිතිය තීරණය කරන යම් ප්‍රමාණයක් ආදායමක් සේ සලකා, ඉතිරිය ඉදිරි කාලච්ඡේද සඳහා බෙදාහැරීමට අරමුදලක් සේ පවත්වා ගැනීම බොහෝ දුරට සිදු වේ.

ClassWork.LK

## පරිත්‍යාග

ලාභ අරමුණු කර නොගත් ආයතනවලට විවිධ පරිත්‍යාග ලැබේ.

මෙවැනි ලැබෙන පරිත්‍යාග සාමාන්‍ය පරිත්‍යාග සහ විශේෂ පරිත්‍යාග ලෙස කොටස් දෙකකට වර්ග කළ හැකි ය.

## සාමාන්‍ය පරිත්‍යාග

සාමාන්‍ය පරිත්‍යාග යනු ආයතනයේ එදිනෙදා කටයුතු පවත්වා ගැනීමට ලැබෙන පරිත්‍යාග වේ.

## සාමාන්‍ය පරිත්‍යාග ගිණුම්ගත කිරීම

ලැබීම් හා ගෙවීම් ගිණුම හර
ආදායම් වියදම් ගිණුම බැර

එනම් සාමාන්‍ය පරිත්‍යාග ලැබෙන වර්ෂයේ ආදායමක් ලෙස වාර්තා කෙරේ.

ClassWork.LK

# විශේෂ පරිත්‍යාග

කිසියම් නිශ්චිත කටයුත්තක් හෝ අරමුණක් සඳහා පරිත්‍යාග ලැබේ නම් එය විශේෂ පරිත්‍යාගයක් වශයෙන් හැඳින්වේ.

**උදා :** ලෙස රු. ලක්ෂ 20 ක වටිනාකමින් යුත් මෝටර් රථයක් පරිත්‍යාගයක් ලෙස ලැබීම දැක්විය හැකි ය.

මෙවැනි විශේෂ පරිත්‍යාග සාමාන්‍යයෙන් ලැබෙන වර්ෂයේ සම්පූර්ණයෙන් ම ආදායමක් ලෙස නොගනියි.

ඒ අනුව ඉහත උදාහරණයට අනුව මෝටර් රථ පරිත්‍යාගය පහත ලෙස ගිණුම් තැබිය හැකි ය.

මෝටර් රථ ගිණුම හර
    පරිත්‍යාග ගිණුම බැර

ClassWork.LK

පරිත්‍යාග ගිණුමේ ශේෂය කොටස් වශයෙන් ආදායමට හඳුනාගත හැකි ය. එය ආයතනයේ කළමනාකාරිත්වය තීරණය කළ යුතු ය.

එසේ කොටස් වශයෙන් ආදායමට හඳුනා ගන්නා විට,

පරිත්‍යාග ගිණුම හර
ආදායම් වියදම් ගිණුම බැර

ලෙස සටහන් කළ යුතු ය.

පරිත්‍යාග ගිණුමේ ඉතිරි ඉතිරි ශේෂය මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සමුච්චිත අරමුදල යටතේ පෙන්නුම් කළ යුතු ය.

ClassWork.LK

## නිදසුන :

සුමග සුභ සාධක සංගමයේ 2017/03/31 දිනෙන් අවසන් වර්ෂයේ සිදු වූ මුදල් ලැබීම් හා ගෙවීම් මෙසේ ය.

### මුදල් ගිණුම / ලැබීම් හා ගෙවීම් ගිණුම

රු.

| | | | |
|---|---|---|---|
| 2016/04/01 අතැති මුදල් | 50 | නඩත්තු වියදම් | 20 000 |
| සාමාජික මුදල් | 50 | ආපනශාලා ආහාර | 60 000 |
| ආපනශාලා ලැබීම් | 100 | දුරකථන ගාස්තු | 10 000 |
| යාවජීව සාමාජික මුදල් | 60 | සේවක වැටුප් | 70 000 |
| ඇතුළත්වීමේ ගාස්තු | 20 | ලිපි ද්‍රව්‍ය | 15 000 |
| වත්කම් කුලියට දීමෙන් | 55 | ආපනශාලා වියදම් | 8 000 |
| | | මුද්‍රණ වියදම් | 10 000 |
| | | පුවත්පත් | 2 000 |
| | | ක්‍රීඩා වියදම් | 12 000 |
| | | බැංකු ණය ගෙවීම් | 20 000 |
| | | 2017/03/31 ශේෂය | 108 000 |
| | 335 | | 335 000 |

## 2016/04/01 දිනට පැවැති ශේෂ

| | රු. |
|---|---|
| ගොඩනැගිල්ල | 100 000 |
| ක්‍රීඩා පිටිය | 250 000 |
| ලී බඩු | 50 000 |
| බැංකු ණය | 200 000 |

ClassWork.LK

# අනෙකුත් තොරතුරු

(01) 2016/04/01 සිට යාවජීව සාමාජිකත්වය ක්‍රියාත්මක කළ අතර එම මුදලින් රු. 4 000 ක් පමණක් වසරේ ආදායම වශයෙන් හඳුනා ගැනේ.

(02) ඇතුළත්වීමේ ගාස්තුවෙන් 2 000 ක් පමණක් වර්ෂයේ ආදායමක් සේ හඳුනා ගැනේ.

(03) වාර්ෂික සාමාජික ගාස්තුව එක් අයෙකුගේ රු. 1000/- කි. 2017. 03. 31 දිනට සංගමයේ සාමාජික සංඛ්‍යාව 50 කි. මෙම වර්ෂය තුළ නව සාමාජිකයින් 15 දෙනෙකු බඳවා ගත් අතර, එයින් පස් දෙනෙක් යාවජීව සාමාජිකයෝ වෙති. එක් අයකුගේ යාවජීව සාමාජික ගාස්තුව රු. 12 000/- කි.

(04) 2015/2016 සඳහා ලද සාමාජික මුදල රු. 7 000 ක්ද, 2017/2018 සඳහා ලද සාමාජික මුදල් 5 000 ක් ලැබූ සාමාජික මුදල්වල අන්තර්ගත වේ.

(05) 2016/04/01 දිනට ආපනශාලා ආහාර තොගය රු. 12 000 ක් වූ අතර, 2017/03/31 දිනට රු. 10 000 ක ආහාර තොගයක් විය. එදිනට ලී බඩුවල වටිනාකම 10% කින් අඩු වී ඇත.

ClassWork.LK

(06) සේවක වැටුප්වලින් 20% ක් ආපනශාලා සේවකයින්ට අදාළ වේ.

2017/03/31 න් අවසන් වර්ෂයේ පහත දෑ පිළියෙල කරන්න.

(01) සාමාජික මුදල් ගිණුම

(02) බාහිර ක්‍රියාකාරකම් ප්‍රතිඵල ගණනය කිරීම

(03) ආදායම් ප්‍රකාශනය / ආදායම් හා වියදම් ගිණුම

(04) 2016/04/01 දිනට සමුච්චිත අරමුදල

(05) 2017/03/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය.

ClassWork.LK

# පිළිතුරු

(01

සාමාජික මුදල් ගිණුම

| | | | |
|---|---|---|---|
| 2016/04/01 ශේෂය | 25 000 | ලැබීම් හා ගෙවීම් | 120 000 |
| ආදායම් හා වියදම් | 45 000 | | |
| 2017/03/31 ශේෂය ප/ගෙ | 50 000 | 2017/03/31 හිඟ ශේෂය ප/ගෙ | 7 000 |
| | 57 000 | | 57 000 |
| 2017.04.01 ශේෂය ඉ/ගෙ | 7 000 | 2017.04.01 ශේෂය ඉ/ගෙ | 5 000 |

(02)

## ආපනශාලා ආදායම් ප්‍රකාශනය

රු.

| | | | |
|---|---|---|---|
| ආපනශාලා ආදායම | | | 100 000 |
| wdmkYd,d úl=Kqï msßjeh | | | |
| ආරම්භක තොගය | 12 000 | | |
| ගැණුම් | 60 000 | | |
| | 72 000 | | |
| - ආපනශාලා අග තොගය | (10 000) | 62 000 | |
| ආපනශාලා වැටුප් ආපනශාලා | | 14 000 | |
| වියදම් ආපනශාලා ලාභය | | 8 000 | (84 000) |
| ආදායම් ප්‍රකාශනයට මාරු කළා | | | 16 000 |

ClassWork.LK

(03)

# සුමග සුබසාධක සංගමය
## 2017/03/31 න් අවසන් වර්ෂය සඳහා
## ආදායම් ප්‍රකාශනය

| | රු. | රු. |
|---|---|---|
| wdodhï සාමාජික මුදල් වත්කම් | 45 000 | |
| කුලී ආදායම් | 55 000 | |
| ආපනශාලා ලාභය | 16 000 | |
| ඇතුළත්වීමේ ගාස්තු | 2 000 | |
| යාවජීව සාමාජික මුදල් | 4 000 | 122 000 |
| úhoï නඩත්තු වියදම් | 20 000 | |
| දුරකථන ගාස්තු | 10 000 | |
| සේවක වැටුප් | 56 000 | |
| ලිපි ද්‍රව්‍ය | 15 000 | |
| මුද්‍රණ වියදම් | 10 000 | |
| පුවත්පත් | 2 000 | |
| ක්‍රීඩා වියදම් | 12 000 | |
| ලී බඩු ක්ෂය | 5 000 | (130 000) |
| ඌණතාව සමුච්චිත අරමුදලට ගෙ/ගි | | (8 000) |

ClassWork.LK

(04)

## 2016/04/31 දිනට සමුච්චිත අරමුදල

| | | රු. | රු. |
|---|---|---|---|
| වත්කම් | ගොඩනැගිලි | 100 000 | |
| | ක්‍රීඩා පිටිය | 250 000 | |
| | ලී බඩු | 50 000 | |
| | ආහාර තොගය | 12 000 | |
| | හිඟ හිටි සාමාජික මුදල | 7 000 | |
| | මුදල් | 50 000 | |
| | | | 469 000 |
| වගකීම් | බැංකු ණය | 200 000 | (200 000) |
| | සමුච්චිත අරමුදල | | 269 000 |

ClassWork.LK

(05)

# සුමග සුබසාධක සංගමය
## 2017/03/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | | |
|---|---|---|
| | | (රු) |
| **ජංගම නොවන වත්කම්** | | |
| ගොඩනැගිල්ල | 100 000 | |
| ක්‍රීඩා පිටිය | 250 000 | |
| ලී බඩු | 45 000 | 395 000 |
| **ජංගම වත්කම්** | | |
| ආහාර තොගය | 10 000 | |
| ලැබිය යුතු සාමාජික මුදල් | 7 000 | |
| මුදල් | 108 000 | 125 000 |
| | | 520 000 |
| **හිමිකම් හා වගකීම්** | | |
| සමුච්චිත අරමුදල | 269 000 | |
| ඌණතාව | (8 000) | 261000 |
| ඇතුළත්වීමේ ගාස්තු . . . | 18 000 | |
| යාවජීව සාමාජික මුදල් | 56 000 | 74 000 |
| **ජංගම නොවන වගකීම්** | | |
| බැංකු ණය | | 180 000 |
| **ජංගම වගකීම්** | | 5 000 |
| කලින් ලද සාමාජික මුදල් | | 520 000 |

ClassWork.LK

# අභ්‍යාස

(01) ලාභ අරමුණු කර නොගත් සංවිධානවල සකස් කරන ගිණුම් නම් කරන්න.

(02) ලාභ අරමුණු කර නොගත් සංවිධානවල ගිණුම් පිළියෙල කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න.

(03) පහත තොරතුරු ඇසුරෙන් සාමාජික මුදල් ගිණුම පිළියෙල කරන්න.

| | |
|---|---|
| 2016/04/01 ලැබිය යුතු සාමාජික මුදල | රු. 6 000 |
| කලින් ලද සාමාජික මුදල | රු. 1 000 |
| 2017/03/31 දිනට හිඟ සාමාජික මුදල | රු. 4 000 |
| කලින් ලද සාමාජික මුදල | රු. 1 000 |
| වර්ෂය තුළ ලැබූ සාමාජික මුදල | රු. 60 000 |

(04) ලාභ අරමුණු කර නොගත් සංවිධානයක පිළියෙල කරන ලැබීම් හා ගෙවීම් ගිණුමක් ආදායම් ප්‍රකාශනයක් අතර වෙනස්කම් දක්වන්න.

(05) සමුච්චිත අරමුදල යන්න හඳුන්වා, එය වෙනස්වීමට හේතු වන කරුණු දක්වන්න.

ClassWork.LK


පළමු මස
නොමිලේ...
2022
ADVANCED
LEVEL
ACCOUNTING
MASS CLASS
ONLINE CLASS
ZOOM තාක්ෂණය ඔස්සේ...
මාර්තු
26
ලියාපදිංචි වීමට :-
076 36 55 550
සෙනසුරාදා
උදෑසන 8.30
සුපුන් මදුශංක
B.sc.(Mgt) Accounting (Special) (U.G.)
University of Sri Jayewardenepura